# නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
# வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
# Ministry of Housing & Samurdhi

මගේ අංකය / எனது இல: / My No. : MHS/DNU/DU/BANK

ඔබේ අංකය / உமது இல: / Your No. :

දිනය / திகதி: / Date : 2015.04.17

දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන්

දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් වෙත

**සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව ඉතුරුම් ප්‍රවර්ධනය හා අළුත් අවුරුදු උත්සව වැඩසටහන 2015**

ඉහත ශීර්ෂය යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති පහත දැක්වෙන චක්‍රලේඛවලට වැඩිමනත් වශයෙනි.

I. අංක 2015/05 දරණ 2015.03.24 දරණ චක්‍රලේඛය
II. DDD/HO/MF/05 දරණ 2015.04.02 දිනැති ලිපිය
III. අංක 2015/05/01 දරණ 2015.04.07 දින දරණ චක්‍රලේඛය
IV. අංක 2015/05/02 දරණ 2015.04.08 දරණ චක්‍රලේඛය
V. අංක 2015/05/03 දරණ 2015.04.10 දරණ චක්‍රලේඛය
VI. අංක 2015/05/04 දරණ 2015.04.16 දරණ චක්‍රලේඛය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015.03.24 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කිරීම තුළින් ඉතුරුම් ප්‍රවර්ධනය වන බවත්, එසේම ඇතැම් දිවිනැගුම ප්‍රජා මූල බැංකු විසින් සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සංවිධානය කිරීම සඳහා රුපියල් 40,000.00 ක සීමාව යටතේ දැනටමත් වියදම් දරා ඇති බවත් අනාවරණය වී ඇත.

එසේම නිවාස හා සමෘද්ධි ගරු අමාත්‍යතුමා හා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශ ලේකම්තුමා වෙත විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන ඉල්ලීම් පිළිබඳව සලකා බලා 2015 වසරේ සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සව කටයුතු සංවිධානය කිරීම වෙනුවෙන් ප්‍රජා මූල බැංකුවකට රුපියල් 40,000.00 ක සීමාවකට යටත්ව වියදම් දැරීම අනුමත කරමි.

2 මහල, "සෙත්සිරිපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල 2வது மாடி, "செத்சிறிபாய", ஸ்ரீ ஜயவர்தனபுர, பத்தரமுல்ல.

මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති ඉහත චක්‍රලේඛවල අනෙකුත් උපදෙස් ඒ ආකාරයෙන්ම බල පැවැත්වෙන බව ද කාරුණිකව දන්වා සිටිමි.

ආර්. ඒ. ඒ. කේ. රණවක

අතිරේක ලේකම් (දිවිනැගුම)

ලේකම් වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කාරුණික දැන ගැනීම සඳහා

02. සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු - කාරුණික දැන ගැනිම සඳහා

03. සියළුම ප්‍රාදේශිය ලේකම්වරු - කාරුණික දැන ගැනිම සඳහා

04. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් - කාරුණික දැන ගැනිම සඳහා